# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2014 අංක 38 දරන ඉඩම්
## (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 2014 ඔක්තෝබර් මස 29 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2014 ඔක්තෝබර් මස 31 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 13.00 යි. තැපැල් ගාස්තුව : රු. 50.00 යි.

# 2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2014 ඔක්තෝබර් මස 29 වැනි දින]

එල්.ඩී.—ඕ. 23/2013.

විදේශිකයන්ට, විදේශීය සමාගම්වලට සහ විදේශීය කොටස් හිමිකාරිත්වයක් ඇති ඇතැම් ආයතනවලට ශ්‍රී ලංකාවේ ඉඩම්වල සන්තකය පැවරීම සීමා කිරීමට විධිවිධාන සැලසීම සඳහා ද; නිදහස් කිරීම් ප්‍රදානය කර ඇති අවස්ථානුගත කරුණු නිශ්චිතව සඳහන් කිරීම සඳහා ද; විදේශිකයන්ට, විදේශීය සමාගම්වලට සහ විදේශීය කොටස් හිමිකාරිත්වයක් ඇති ඇතැම් ආයතනවලට ඉඩම් බද්දට දීම වෙනුවෙන් ඉඩම් බදුකරණ බද්දක් පැනවීම සඳහා ද; ඇතැම් සංවර්ධන ව්‍යාපෘති සඳහා සහන සැලසීම සඳහා ද; 1963 අංක 11 දරන මුදල් පනතේ VI වන කොටස ඉවත් කිරීම සඳහා ද; ඊට සම්බන්ධ සහ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

රජය විසින් වැඩිදුරටත් සංවර්ධන ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කරමින් පවතින ගෝලීය ලෙස අනුකලනය වූ පරිසර පසුබිමක දී, ජාතික දේපළ ආරක්ෂා වන ආකාරයෙන් සීමිත සම්පතක් ලෙස පවතින ඉඩම් විචක්ෂණශීලීව භාවිත කිරීම තහවුරු කිරීමට යෝග්‍ය සහ අවශ්‍ය යයි සලකන හෙයින් ද: පූර්විකාව.

මේ පනතේ දක්වා ඇති පරිදි විදේශිකයන්ට, විදේශීය සමාගම්වලට සහ විදේශීය කොටස් හිමිකාරිත්වයක් ඇති ඇතැම් ආයතනවලට ඉඩම් පැවරීමේ දී සීමා පනවමින් සහ ඇතැම් සංවර්ධන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට සහන ප්‍රදානය කරමින් ක්ෂය නොවන ආකාරයකින් ඉඩම් භාවිතය විධිමත් කිරීම ජාතික ප්‍රතිපත්තිය වී ඇති හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. (1) මේ පනත 2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

(2) මේ පනතේ විධිවිධාන 2013 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

ඉඩම් පැවරීම පිළිබඳ සීමා කිරීම.

2. (1) වෙනත් යම් ලිඛිත නීතියක යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති යම් ඉඩමක හිමිකම—

(අ) විදේශිකයකුට; හෝ

(ආ) සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද, විදේශීය කොටස් හිමිකාරිත්වය සෘජුව හෝ වක්‍රව සියයට පනහක් හෝ ඊට වැඩි සමාගමකට; හෝ

(ඇ) විදේශීය සමාගමකට,

පවරනු ලබන්නේ නම්, 3 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි නිදහස් කිරීමක් සිදු කර ඇත්නම් මිස, ඒ පැවරීම තහනම් විය යුතු ය.

(2) (අ) සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද විදේශීය කොටස් හිමිකාරිත්වය සියයට පනහකට වඩා අඩු සමාගමකට ඉඩම් පැවරීමක දී, ඒ පැවරීමේ නීත්‍යානුකූලභාවය පැවතීම සඳහා, ඒ සමාගමේ විදේශීය කොටස් හිමිකාරිත්වය, ඒ පැවරීමේ දින සිට අනුක්‍රමික වසර විස්සක (20) අවම කාලසීමාවක් සඳහා සියයට පනහකට අඩුවෙන් පැවතිය යුතු ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් කර ඇති සමාගමක විදේශීය කොටස් හිමිකාරිත්වය, (අ) ඡේදයේ විධිවිධානවලට පටහැනිව—

(i) සෘජුව හෝ වක්‍ර ලෙස කොටස් අයිතිය වෙනස් වීමේ: හෝ

(ii) ඒ සමාගමේ කොටස් හිමිකරුවකු මරණයට පත්වීමේ සහ ශ්‍රී ලංකාවේ අදාළ අනුප්‍රාප්ති නීතියට අනුව මියගිය කොටස් හිමියාගේ කොටස්, විදේශිකයකු වන ඔහුගේ ළඟම ඥාතියාට උරුම වීමේ,

ප්‍රතිඵලයක් වශයෙන්, සියයට පනහක් වන හෝ සියයට පනහ ඉක්මවන අවස්ථාවක දී, එම ඡේදයේ සඳහන් වන

ඉඩම් පැවරීම, එකී විදේශීය කොටස් හිමිකාරිත්වය වැඩි වූ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි බලරහිත විය යුතු අතර ඊට නීතියේ බලාත්මකභාවයක් නොතිබිය යුතු ය:

එසේ වුව ද:

(i) (අ) ඡේදයේ සඳහන් කරන ලද, කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ නිල ලැයිස්තුගත (දිරි සවි පුවරුවක් සම්බන්ධයෙන් වන විට කොටස් හිමියන් අවම වශයෙන් දෙසියයක් ද, ප්‍රධාන පුවරුවක් සම්බන්ධයෙන් වන විට කොටස් හිමියන් එක් දහසක් ද සහිත) සමාගමක්, එහි විදේශීය කොටස් හිමිකාරිත්වය, වැඩි වූ දිනයේ සිට මාස දොළහක කාලසීමාවක් තුළ, එම විදේශීය කොටස් හිමිකාරිත්වය (අ) ඡේදයේ විධිවිධානවලට අනුකූලව, සියයට පනහකට වඩා අඩු කිරීමට පියවර ගෙන ඇති අවස්ථාවක; හෝ

(ii) (i) ඡේදයේ සඳහන් සමාගමක් නොවන, (අ) ඡේදයේ සඳහන් කරන ලද සමාගමක්, එහි විදේශීය කොටස් හිමිකාරිත්වය වැඩි කරනු ලැබූ දිනයේ සිට මාස හයක කාලසීමාවක් තුළ, එම විදේශීය කොටස් හිමිකාරිත්වය (අ) ඡේදයේ විධිවිධානවලට අනුකූලව සියයට පනහකට වඩා අඩු කිරීමට, පියවර ගෙන ඇති අවස්ථාවක,

ඒ සමාගමේ විදේශීය කොටස් හිමිකාරිත්වය යථා තත්ත්වයට පත්කරනු ලැබූ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි, ඒ ඡේදයේ සඳහන් කර ඇති ඉඩමක හිමිකම පැවරීම, නීත්‍යානුකූලව වලංගුව පවතින බවට සලකනු ලැබිය යුතු ය.

(ඇ) මේ වගන්තියේ කාර්ය සඳහා "දිරි සවි පුවරුව" සහ "ප්‍රධාන පුවරුව" යන යෙදුම්, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 53 වන වගන්තිය යටතේ සාදනු ලැබ, 2001 දෙසැම්බර් මස 18 වන දින අංක 1215/2 දරන අති-විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන

ලද, 2001 ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති ප්‍රකාර, ලැයිස්තුගත කිරීමේ නියමයන් ලෙස නිකුත් කරන ලද කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීතිවලට අනුව කියවා තේරුම් ගත යුතු ය.

2 වන වගන්තියේ විධිවිධාන අදාළ වීමෙන් නිදහස් කිරීම.

3. (1) පහත දැක්වෙන අවස්ථාවල දී, 2 වන වගන්තියේ විධිවිධාන අදාළ කර නොගත යුතු ය:—

(අ) තානාපති වරප්‍රසාද පනතේ අර්ථානුකූලව වෙනත් රාජ්‍යයක රාජ්‍ය දූත මණ්ඩලයකට හෝ ඒ පනත ප්‍රකාරව පිළිගත් ජාත්‍යන්තර බහුපාර්ශ්වීය හෝ ද්විපාර්ශ්වීය සංවිධානයකට හිමිකම පවරනු ලබන යම් ඉඩමකට;

(ආ) (බද්ධ නිවාස අයිතිකම් පනතේ අර්ථානුකූලව බිම් මහල සහ යම් පොදු උපාංගයක් හෝ උපාංගවලින් පමණක් සමන්විත මහල් බැහැර කරමින්) බද්ධ නිවාස අයිතිකම් පනතේ විධිවිධානවල නිශ්චිතව සඳහන් ගොඩනැගිල්ලක හතරවන මහල හෝ ඊට ඉහළින් පිහිටා ඇති සහාධිපත්‍ය දේපළකට:

එසේ වුව ද, අදාළ පැවරුම් ඔප්පුව ලියා අත්සන් කිරීමට පෙරාතුව මුළු වටිනාකම ආමුඛ විදේශීය ප්‍රේෂණ හරහා කලින් ගෙවනු ලැබිය යුතු ය;

(ඇ) 2013 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව බදු පාලනය පිළිබඳව අදාළ වූ යම් ලිඛිත නීතියක් මත පදනම්ව ව්‍යුහගත කරනු ලැබුවා වූ ද, සෘජු විදේශ මුදල් ආයෝජනයක් සහිත වූ ද, ශ්‍රී ලංකාවට කරනු ලබන විදේශීය ආමුඛ ප්‍රේෂණ මඟින් ගිවිසුම අනුව කටයුතු කරනු ලැබ ඇත්තා වූ ද, ගිවිසුමක් ප්‍රකාරව, 2013 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව එළඹි අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව විදේශීය ආයෝජකයකුට පවරනු ලබන යම් ඉඩමකට;

(ඈ) ඉඩම් හිමිකරුගේ (විදේශිකයකු වන) ළඟම ඥාතියාට, ශ්‍රී ලංකාවේ අදාළ අනුප්‍රාප්ති නීතියට අනුකූලව, තෙස්තමේන්තු විරහිතව, ත්‍යාගයක් හෝ තෙස්තමේන්තු නියාදනයක් මඟින් හිමිකම පවරනු ලබන යම් ඉඩමකට;

(ඉ) පුරවැසි පනතේ අර්ථානුකූලව ශ්‍රී ලංකාවේ ද්විත්ව පුරවැසියකුට හිමිකම පවරනු ලබන යම් ඉඩමකට;

(ඊ) සියයට පනහක් හෝ ඊට වැඩි විදේශීය කොටස් හිමිකාරිත්වයක් සහිත බැංකු පනත යටතේ බලපත්‍රලත් යම් බැංකුවක්—

(i) ඒ බැංකුවට උකස් කර ඇති ඒ ඉඩම උකසෙන් නිදහස් කර ගැනීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ හෝ (89 වන අධිකාරය වූ) උකස් පනතේ නියමයන් ප්‍රකාර, ඒ බැංකුව මගින් පවත්වනු ලබන වෙන්දේසියක දී;

(ii) එවැනි බැංකුවක් විසින් දෙන ලද ණයක් අයකර ගැනීම බලාත්මක කිරීම පිණිස වූ අධිකරණයේ තීන්දු ප්‍රකාශයක් ක්‍රියාත්මක කිරීමක දී,

ඒ බැංකුවට හිමිකම පවරනු ලබන යම් ඉඩමකට;

(උ) සියයට පනහක් හෝ ඊට වැඩි විදේශීය කොටස් හිමිකාරිත්වයක් සහිත කල්බදු මූල්‍යකරණ ආයතනයකට—

(i) කල්බදු සඳහා ඇපයක් වශයෙන් එකී ඉඩම උකස් කර තිබිය දී;

(ii) කල් බද්දක් සහ විකිණීම සඳහා වූ ගිවිසුමක් හෝ ණයක් සහ විකිණීම සඳහා වූ ගිවිසුමක් ක්‍රියාත්මක කිරීමේ අරමුණින්;

(iii) ඒ ආයතනය විසින් දෙන ලද ණයක් අයකර ගැනීම බලාත්මක කරනු පිණිස අධිකරණය විසින් දෙන ලද තීන්දු ප්‍රකාශයක් ක්‍රියාත්මක කිරීමේ දී,

හිමිකම පවරනු ලබන යම් ඉඩමකට;

(ඌ) 2013 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී මේ පනතට කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව

සටහන් කරනු ලබන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ, 2(1)(ආ) වගන්තියේ සඳහන් කර ඇති සමාගමකට හිමිකම පවරනු ලබන යම් ඉඩමක්, ඒ හිමිකම පවරනු ලබන දිනයට පෙරාතුව ම වූ අනුක්‍රමික වසර දහයකට (10) නොඅඩු කාලසීමාවක් ඒ සමාගම ශ්‍රී ලංකාව තුළ ක්‍රියාකාරීව කටයුතු කර ඇති අවස්ථාවක දී,

(2) 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ විධිවිධාන ප්‍රකාරව විදේශීය අස්තිත්වයක් විසින් පවත්වාගෙන යනු ලබන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් හඳුනාගනු ලැබ ඇති බැංකු, මූල්‍ය, රක්ෂණ, සමුද්‍රීය, ගුවන් සන්තරණ, උසස් තාක්ෂණ හෝ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියක්, ඉඩම් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා, අමාත්‍ය මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින්, 2 වන වගන්තියේ විධිවිධාන අදාළ වීමෙන් නිදහස් කරනු ලැබිය හැකි ය.

(3) ගෝලීය හෝ කලාපීය ක්‍රියාකාරකම් ස්ථානගත කිරීම හෝ නැවත ස්ථානගත කිරීම සඳහා හෝ ශාඛා කාර්යාලයක් පිහිටුවීම සඳහා ජාත්‍යන්තර වාණිජ ව්‍යාපාරවල නිරතවන යම් විදේශීය සමාගමක් වෙත පවරනු ලබන ඉඩමක්, ඉඩම් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා, අමාත්‍ය මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින්, 2 වන වගන්තියේ විධිවිධාන අදාළ වීමෙන් නිදහස් කරනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තිය යටතේ ඉඩමක හිමිකම පවරනු ලැබූ අවස්ථාවක, ඒ ඉඩම හෝ එහි කොටසක තදනන්තර සෑම හිමිකම පැවරීමකට ද, මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

ඉඩම් හිමිකම පැවරීමට අදාළ සාධන පත්‍ර ලියාපදිංචි කිරීම සඳහා වන කොන්දේසි.

4. (1) 2 වන වගන්තියේ සඳහන් කරන ලද යම් හිමිකම පැවරීමක් සිදුකෙරෙන සාධන පත්‍රයක්, ඒ පැවරීම මේ පනතේ විධිවිධානවලට අනුකූල වන බවට ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා සෑහීමට පත්වන්නේ නම් මිස, ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කිරීම සිදු නොකළ යුතු ය.

(2) (අ) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ඉඩමක හිමිකරුගේ (විදේශිකයකු වන) ළඟම ඥාතියාට ඒ ඉඩම පැවරීම සිදුකෙරෙන සාධන පත්‍රයක් සහතික කරන ප්‍රසිද්ධ

නොතාරිස්වරයකු විසින්, ශ්‍රී ලංකාවේ අදාළ වන අනුප්‍රාප්ති නීති මගින් පිළිගෙන ඇති පරිදි පැවරුම්ලාභියා, පවරන ලද ඉඩමේ අයිතිකරුගේ ළඟම ඥාතියා බවට, ස්වකීය සහතිකයේ සහතික කර ඇති අවස්ථාවක, ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා විසින් එකී සාධන පත්‍රය ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(ආ) යම් තැනැත්තකු ඉඩම හිමිකරුගේ ළඟම ඥාතියා ද යන්න, නැතහොත් අනුප්‍රාප්තියට අදාළ වන නීතිය කුමක් ද යන්න පිළිබඳ යම් ප්‍රශ්නයක් පැන නගින අවස්ථාවක දී, ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා විසින්, ඒ කාරණය ලඝු ආකාරයෙන් විභාග කරනු ලබන නඩු කටයුත්තක් මගින් තීරණය කිරීමට, අදාළ ඉඩම පිහිටා ඇති ප්‍රදේශයේ අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත යොමු කරනු ලැබිය යුතු ය.

(3) සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද විදේශීය කොටස් හිමිකාරිත්වය සියයට පනහකට වඩා අඩු සමාගමකට ඉඩමක හිමිකම පවරා ඇති අවස්ථාවක දී, ඒ සමාගමේ විදේශීය කොටස් හිමිකාරිත්වය, තත්කාලයේ නිකුත් කර ඇති මුළු කොටස් සංඛ්‍යාවෙන් සියයට පනහකට වඩා අඩු බවට, ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කරන ලෙස, ඒ සමාගමේ ලේකම්වරයාට නියම කිරීමෙන්, ඒ සමාගමේ විදේශීය කොටස් හිමිකාරිත්වය සියයට පනහකට වඩා අඩුවෙන් පවතින බව තමා විසින් ම සනාථ කර ගැනීම, ඉඩම් රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යය විය යුතු ය.

(4) (අ) අදාළ පැවරුම් ඔප්පුව ලියාපදිංචි කරනු ලැබූ දිනයේ සිට, සෑම හය මාසක කාල සීමාවකට වරක් ම, ඒ සමාගමේ විදේශීය කොටස් හිමිකාරිත්වය, එකී මාස හයක කාලසීමාව තුළ, ඒ සමාගම විසින් නිකුත් කර ඇති මුළු කොටස් සංඛ්‍යාවෙන් සියයට පනහක් නොඉක්මවා පවතින බවට, ඉඩම් රෙජිස්ට්‍රාර්වරයාට ලිඛිතව දැනුම් දීම, අදාළ සමාගමේ ලේකම්වරයාගේ කාර්යය වන්නේ ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් කර ඇති සමාගමක් ස්වකීය විදේශීය කොටස හිමිකාරිත්වය සියයට පනහක් දක්වා හෝ සියයට පනහ ඉක්මවන ලෙස වැඩි කළ අවස්ථාවක, අදාළ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ පිළිබඳව අදාළ පත්ඉරුවේ සටහනක් යොදනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ කාර්ය සඳහා "ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා" යන්නෙන් ලියාපදිංචි කිරීම සඳහා පැවරීමේ සාධන පත්‍රය ඉදිරිපත් කරනු ලබන අදාළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා අදහස් වේ.

විදේශිකයන්ට ඉඩම් බද්දට දීමේ සීමා.

5. (1) වෙනත් යම් ලිඛිත නීතියක යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද—

(අ) විදේශිකයකුට; හෝ

(ආ) සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද, විදේශීය කොටස් හිමිකාරිත්වය, සෘජුව හෝ වක්‍රව සියයට පනහක් හෝ ඊට වැඩි සමාගමකට; හෝ

(ඇ) විදේශීය සමාගමකට,

ඉඩමක් බද්දට දීමේ දී, 6 වන වගන්තිය යටතේ පනවන ලද ඉඩම් බදුකරණ බද්ද ගෙවීමට යටත්ව ඒ බදු දීම සිදු කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, එවැනි යම් බද්දක උපරිම බදු කාලය අනූනව අවුරුද්දක් නොඉක්මවිය යුතු ය.

(2) එසේ බද්දට දුන් යම් රජයේ ඉඩමක් බදු කාල සීමාව ඉකුත් වීමෙන් පසුව සියලු බැඳීම්වලින් නිදහස්ව රජයට නැවත පවරනු ලැබිය යුතු ය.

(3) එසේ බද්දට දෙන ලද රජයේ ඉඩමක් අදාළ බදු ගිවිසුමේ විධිවිධාන උල්ලංඝනය කරමින් හෝ ඉඩම් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමතය නොමැතිව අතුරු කුලියට දීම හෝ අතුරු බද්දට දීම නොකළ යුතු ය.

විදේශිකයන්ට බදු දෙන ඉඩම් සඳහා වන බද්ද.

6. (1) 7 වන වගන්තිය යටතේ නිදහස් කර ඇත්නම් මිස, බදු සාධන පත්‍රයක් ලියා අත්සන් කිරීමේ දී හෝ ඒ අත්සන් කිරීමට පෙරාතුව, බද්දට දෙන සෑම ඉඩමක් සඳහා ම, 5(1) වන වගන්තිය ප්‍රකාරව බදු ගැණුම්කරු විසින් කලින් ඉඩම් බදුකරණ බද්ද ගෙවනු ලැබිය යුතු ය.

(2) එකී ඉඩම් බදුකරණ බද්දෙහි බදු අනුපාතය සම්පූර්ණ බදු කාලසීමාව සඳහා ගෙවිය යුතු මුළු බදු මුදලින් සියයට පහළොවක ප්‍රතිශතයක් විය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, පහත සඳහන් අවස්ථාවල දී, ඉඩම් බදුකරණ බද්ද, සම්පූර්ණ බදු කාල සීමාව සඳහා ගෙවිය යුතු මුළු බදු මුදලින් සියයට 7.5 ක ප්‍රතිශතයක් විය යුතු ය:—

(අ) 5(1) (අ) වන වගන්තියේ සඳහන් කර ඇති සමාගමක් බදු ගිවිසුමේ දිනයට පෙරාතුව ම වූ අනුගාමී වසර දහයකට (10) නොඅඩු කාලයක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාකාරී ලෙස කටයුතු කර ඇති අවස්ථාවක දී, ඒ සමාගමට බදු දෙන ලද ඉඩමක්;

(ආ) සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද්දා වූ ද, පාලක සමාගමේ විදේශීය කොටස් හිමිකාරිත්වය සියයට පනහක් හෝ ඊට වැඩි වූ ද, පාලිත සමාගමේ කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි හිමිකාරිත්වයක් පාලක සමාගම විසින් දරන්නා වූ ද, පාලක සමාගමක්, බදු සාධන පත්‍රයේ දිනයට පෙරාතුව ම වූ අනුක්‍රමික වසර දහයකට (10) නොඅඩු කාලසීමාවක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාකාරී ලෙස කටයුතු කර ඇති අවස්ථාවක දී, ඒ පාලිත සමාගමට බදු දෙන ලද ඉඩමක්:

එසේ වුවද, පාලක සමාගම විසින් පාලිත සමාගමෙහි දරන කොටස් හිමිකාරිත්වය සියයට පනහකට වඩා අඩුවීමක් සිදුවන විට, එවැනි බදු දීමක් සඳහා අදාළ වන ඉඩම් බදුකරණ බද්ද, එසේ කොටස් හිමිකාරිත්වය අඩු වූ දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඉතිරි බදු කාලසීමාව සඳහා සියයට පහළොවක ප්‍රතිශතයක් විය යුතු ය;

(ඇ) බදු කාලසීමාව අවුරුදු තිස් පහට වඩා අඩුවන අවස්ථාවක දී, බද්ධ නිවාස අයිතිකම් පනතේ විධිවිධාන යටතේ නිශ්චිතව සඳහන් ගොඩනැගිල්ලක හතරවන මහල හෝ ඊට ඉහළින් පිහිටා ඇති සහාධිපත්‍ය දේපළක්;

(ඇ) බදු කාලසීමාව අවුරුදු අනූනවයට වඩා නොවැඩි වන අවස්ථාවක දී, බද්ධ නිවාස අයිතිකම් පනතේ විධිවිධාන යටතේ නිශ්චිතව සඳහන් ගොඩනැගිල්ලක හතරවන මහලට පහළින් පිහිටා ඇති සහාධිපත්‍ය දේපළක්;

(ඉ) 5 වන වගන්ති ප්‍රකාරව බදු දෙනු ලබන—

(i) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ ප්‍රකාශයට පත් කරන ලද බලපත්‍රලත් කලාපයක; හෝ

(ii) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත යටතේ හෝ 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත යටතේ ප්‍රකාශයට පත් කරන ලද සංචාරක සංවර්ධන ප්‍රදේශයක; හෝ

(iii) 1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද කර්මාන්ත පුරයක; හෝ

(iv) අඩුකරන ලද බදු අනුපාතය අදාළ වන ප්‍රදේශයක් ලෙස අමාත්‍යවරයා විසින් නියෝග මගින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයක,

පිහිටි ඉඩමක්;

(ඊ) 5(1) (ආ) වගන්තියේ සඳහන් කරන ලද සමාගමකට, අදාළ ක්ෂේත්‍රය තුළ ස්වකීය තරඟකරුවන් අතරේ සම තලයක කටයුතු කිරීමට මඟ සැලසීමේ අරමුණින් අදාළ ක්ෂේත්‍රය තුළ ඒ සමාගම විසින් දැනටමත් විදේශ මුදලින් සැලකිය යුතු ආයෝජනයක් සිදු කර ඇති බව සැළකිල්ලට ගෙන, අඩු කරන ලද බදු අනුපාතය ඒ සමාගමට අදාළ කරනු ලැබීම යුක්තිසහගත වන බවට, අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලැබ, ඒ සමාගමට බදු දෙන ලද යම් ඉඩමක්.

(4) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද බදු ගැණුම්කරු, ඉඩම් බදුකරණ බද්දට අමතරව 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනත යටතේ අදාළ මුද්දර ගාස්තු ගෙවීමට ද, එවැනි යම්

ගනුදෙනුවක් සම්බන්ධයෙන් ගෙවිය යුතු බද්දක් හෝ අය කිරීමක්, තත්කාලයේ බලාත්මකව පවත්නා අදාළ යම් ලිඛිත නීතියකට අනුකූලව ගෙවීමට ද යටත් වන්නේ ය.

(5) ඉඩම් බදුකරණ බද්ද, නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකින් ගෙවනු ලැබිය යුතු ය.

7. (1) 6 වන වගන්තිය යටතේ ගෙවනු ලැබිය යුතු ඉඩම් බදුකරණ බද්ද, පහත දැක්වෙන අවස්ථාවල දී, අදාළ කර නොගත යුතු ය:— ඉඩම් බදුකරණ බද්දෙන් නිදහස් කිරීම.

(අ) තානාපති වරප්‍රසාද පනතේ අර්ථානුකූලව වෙනත් රාජ්‍යයක රාජ්‍ය දූත මණ්ඩලයකට හෝ ඒ පනත ප්‍රකාරව පිළිගත් ජාත්‍යන්තර බහුපාර්ශ්වික හෝ ද්විපාර්ශ්වික සංවිධානයකට යම් ඉඩමක් බද්දට දීමේ දී;

(ආ) (බද්ද නිවාස අයිතිකම් පනතේ අර්ථානුකූලව බිම් මහල සහ යම් පොදු උපාංගයක් හෝ උපාංගවලින් සමන්විත මහල් බැහැර කරමින්) බද්ධ නිවාස අයිතිකම් පනතේ නිශ්චිතව සඳහන් ගොඩනැගිල්ලක හතරවන මහල හෝ ඊට ඉහළින් පිහිටා ඇති සහාධිපත්‍ය දේපලක්, වසර තිස් පහක් හෝ ඊට වැඩි කාල සීමාවකට බදු දීමේ දී, අදාළ බදු සාධන පත්‍රයේ දිනයේ දී හෝ ඊට පෙරාතුව ම සම්පූර්ණ බදු කාල සීමාව සඳහා මුළු බදු මුදල විදේශීය ආමුඛ ප්‍රේෂණ මඟින් ගෙවනු ලැබ ඇති අවස්ථාවක දී;

(ඇ) පුරවැසි පනතේ අර්ථානුකූලව ශ්‍රී ලංකාවේ ද්විත්ව පුරවැසියකුට යම් ඉඩමක් බදු දීමේ දී;

(ඈ) 2013 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව බදු පාලනය පිළිබඳව අදාළ වන යම් ලිඛිත නීතියක් මත පදනම්ව ව්‍යුහගත කරනු ලැබුවා වූ ද, සෘජු විදේශ මුදල් ආයෝජනයක් සහිත වූ ද, ශ්‍රී ලංකාවට විදේශ මුදල් ප්‍රේෂණය කිරීමෙන් ගිවිසුම අනුව කටයුතු කරනු ලැබ ඇත්තා වූ ද, 2013 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව එළඹි අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව විදේශීය ආයෝජකයකුට යම් ඉඩමක් බදු දීමේ දී;

(ඉ) 2012 අංක 12 දරන මුදල් පනත යටතේ ප්‍රකාශයට පත් කර ඇති බන්ධිත ප්‍රදේශයක් හෝ නිදහස් වරායක් තුළ පිහිටා ඇති යම් ඉඩමක් බදු දීමේ දී.

(2) 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ විධිවිධාන ප්‍රකාරව විදේශීය අස්ථිත්වයක් විසින් පවත්වාගෙන යනු ලබන, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් හඳුනාගනු ලැබ ඇති බැංකු, මූල්‍ය, රක්ෂණ, සමුද්‍රීය, ගුවන් සන්තරණ, උසස් තාක්ෂණ හෝ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියක්, ඉඩම් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා, අමාත්‍ය මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මඟින්, 6 වන වගන්තියේ විධිවිධාන අදාළ වීමෙන් නිදහස් කරනු ලැබිය හැකි ය.

(3) ගෝලීය හෝ කලාපීය ක්‍රියාකාරකම් ස්ථානගත කිරීම හෝ නැවත ස්ථානගත කිරීම සඳහා හෝ ශාඛා කාර්යාලයක් පිහිටුවීම සඳහා, ජාත්‍යන්තර වාණිජ ව්‍යාපාරවල නිරතවන යම් විදේශීය සමාගමක් වෙත බදු දෙනු ලබන ඉඩමක්, ඉඩම් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා, අමාත්‍ය මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මඟින්, 6 වන වගන්තියේ විධිවිධාන අදාළ වීමෙන් නිදහස් කරනු ලැබිය හැකි ය.

බදු සාධන පත්‍රය ලියාපදිංචි කිරීමේ කොන්දේසි.

8. (1) 5 (1) වන වගන්තියේ සඳහන් කරන ලද යම් ඉඩමක්, යම් තැනැත්තකුට හෝ සමාගමකට බද්දට දීම සිදු කරනු ලබන සාධන පත්‍රයක්, ඒ බද්ද සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධානවලට අනුකූලව ඉඩම් බදුකරණ බද්ද ගෙවා ඇති බවට සෑහීමට පත්වන්නේ නම් මිස, ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා විසින් ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කිරීම නොකළ යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා "ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා" යන්නෙන් ලියාපදිංචිය සඳහා සාධන පත්‍රය ඉදිරිපත් කරනු ලබන ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අදාළ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා අදහස් වේ.

බලාත්මක කිරීම.

9. (1) 6 වන වගන්තිය යටතේ පනවන ලද ඉඩම් බදුකරණ බද්ද දේශීය ආදායම් කොමසාරිස්- ජනරාල්වරයා විසින් අය කිරීම හා එකතු කිරීම කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ ගෙවනු ලැබිය යුතු ඉඩම් බදුකරණ බද්දක් බලාත්මක කිරීම සහ ඒ සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, දේශීය ආදායම් පනතේ විධිවිධාන, අදාළ කර ගනු ලැබිය යුතු ය.

ඉඩම් බදුකරණ බද්ද ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු බව.

10. 9 වන වගන්තිය යටතේ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් අයකරනු ලබන හෝ එකතු කරනු ලබන ඉඩම් බදුකරණ බද්ද ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ය.

විදේශිකයකුට හිමිකම පවරා ඇති හෝ බද්දට දී ඇති ඉඩම් උකස් කිරීම සීමා කිරීම.

11. (1) මේ පනතට කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව සටහන් කරනු ලබන දිනයට පසුව, පැවරීමක් හෝ බදු දීමක් මගින් යම් තැනැත්තකුට හෝ සමාගමකට පවරා ඇති, 2 (1) වන වගන්තියේ හෝ 5 (1) වන වගන්තියේ සඳහන් යම් ඉඩමක්, අදාළ පැවරීමේ හෝ බදු දීමේ සාධන පත්‍රයේ දින සිට වසර පහක කාලයක් සඳහා කිසිදු කාර්යයක් වෙනුවෙන් බැංකු පනත යටතේ බලපත්‍රලත් යම් බැංකුවකට උකස් කිරීම හෝ ඔඩපනය කිරීම නොකළ යුතු ය.

(2) ඉහත (1) වන උපවගන්තිය උල්ලංඝනය කරමින් සිදුකරන යම් උකස් කිරීමක් හෝ ඔඩපනය කිරීමක් බලරහිත විය යුතු ය.

නිදහස් කරන ලද පැවරුම් සහ බදු සම්බන්ධයෙන් ජාතික රාජ්‍ය සභාවේ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත අදාළ කර ගැනීම.

12. මේ පනතේ විධිවිධාන අදාළ කර ගැනීමෙන් නිදහස් කරන ලද ඉඩමක, යම් හිමිකම පැවරීමක් හෝ බද්දට දීමක් සම්බන්ධයෙන්, යම් තැනැත්තකු විසින් අයිතිය දැරිය හැකි ඉඩම්වල උපරිම ප්‍රමාණය පිළිබඳ ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ විධිවිධාන තවදුරටත් අදාළ කර ගනු ලැබිය යුතු ය.

තක්සේරු කිරීම.

13. (1) මේ පනතේ කාර්ය සඳහා—

(අ) රජයේ ඉඩමක වටිනාකම රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් නිශ්චය කරනු ලබන ආකාරයට විය යුතු ය; සහ

(ආ) යම් පුද්ගලික ඉඩමක වටිනාකම බලපත්‍රලත් තක්සේරුකරුවකු විසින් නිශ්චය කරනු ලබන ආකාරයට විය යුතු ය.

(2) 5 වන වගන්තියේ සඳහන් කරන ලද බද්දකට අදාළ වන සම්පූර්ණ බදු මුදල, (1) වන උපවගන්තිය යටතේ සිදුකරන ලද ඉඩම් තක්සේරුව මත පදනම්ව ගණනය කරනු ලැබිය යුතු ය.

වැරදි සහ දඬුවම්.

14. (1) මේ පනත යටතේ ඉඩම් බදුකරණ බද්ද ගෙවීමට යටත්වන යම් තැනැත්තකු, මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි ඒ බද්ද ගෙවීම පැහැර හරින අවස්ථාවක දී, මේ පනත යටතේ බදු පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) එවැනි යම් පැහැර හරින්නකු මේ පනත යටතේ වරදක් සිදුකරනු ලබන අතර, ඒ බද්ද අයකර ගැනීම සඳහා සහ එයට දඬුවම් ලබාදීම පිණිස පැහැර හරින්නාට එරෙහිව සිදුකරන යම් නඩු කටයුත්තක දී සහ ඒ සම්බන්ධයෙන්, දේශීය ආදායම් පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ කරගනු ලැබිය යුතු ය.

පුද්ගල මණ්ඩලයක් විසින් සිදුකරන වැරදි.

15. පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වරදක් සිදුකරන අවස්ථාවක දී, ඒ පුද්ගල මණ්ඩලය—

(අ) සංස්ථාපිත මණ්ඩලයක් නම්, ඒ සංස්ථාපිත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු ම සහ නිලධරයකු ම: හෝ

(ආ) වෙළෙඳ ව්‍යාපාරයක් නම්, ඒ වෙළෙඳ ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකු ම; හෝ

(ඇ) වෙළෙඳ ව්‍යාපාරයක් නොවන සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක් නම්, ඒ මණ්ඩලයේ කළමනාකරණය සහ පාලනය සඳහා වගකිව යුතු සෑම නිලධරයකු ම,

ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඔහු විසින් ඒ වරද ඔහුගේ අනුදැනුමක් නොමැතිව සිදු කළ බව සහ ඒ වරද සිදුකිරීම වැළැක්වීමට ඔහු නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ බව ඔප්පු කරන්නේ නම්, ඒ තැනැත්තා ඒ වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

සංවර්ධන ව්‍යාපෘති සඳහා සහන.

16. රජයේ ඉඩම්වල සින්නක්කර අයිතිය හෝ බදු අයිතිය පැවරිය යුතු සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් අමාත්‍ය මණ්ඩලය විසින්

අනුමත කළ ව්‍යාපෘතියක් සඳහා රජයේ ඉඩමක් පැවරීමේ දී හෝ බදු දීමේ දී, 13 වන වගන්තිය යටතේ නිශ්චය කරන ලද ඉඩමේ වටිනාකමෙන් හෝ සම්පූර්ණ බදු මුදලින් සියයට විසිපහක වට්ටමක් ඒ ව්‍යාපෘතියට ප්‍රදානය කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, එවැනි යම් සංවර්ධන ව්‍යාපෘතියක්—

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විසින්; හෝ

(ආ) සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කළ, ශ්‍රී ලංකාවේ පුරවැසියන් විසින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක කොටස් හිමිකාරිත්වය දරන සමාගමක් විසින්,

ක්‍රියාත්මක කරනු ලබන්නක් විය යුතු ය.

17. (1) නියම කළ යුතු කාරණා වශයෙන් මේ පනතින් නියමිත සහ නියෝග සෑදීමට මේ පනතින් බලය දී ඇති කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) එවැනි සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලැබූ දිනයේ දී හෝ නියෝගයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි පසු දිනයක දී හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) එවැනි සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු, හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. පාර්ලිමේන්තුව විසින් එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් අගතියක් නොවිය යුතු ය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකෙන දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

18. මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කරමින් සිදු කරන යම් ඉඩම් පැවරීමක් බල රහිත විය යුතු අතර ඊට කිසිදු නීතිමය බලපෑමක් නොතිබිය යුතු ය. මේ පනත උල්ලංඝනය කරමින් ඉඩම් පැවරීම බල රහිත විය යුතු බව.

1963 අංක 11 දරන පනතේ VI වන කොටස ඉවත් කිරීම.

19. 1963 අංක 11 දරන මුදල් පනතේ VI වන කොටස (ඇතැම් කොන්දේසි යටතේ දේපළ පැවරීම මත බදු පැනවීම) මෙයින් ඉවත් කරනු ලැබේ.

සැක දුරු කිරීම.

20. සැක දුරු කිරීම සඳහා පහත සඳහන් පරිදි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) 2013 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ලියා සහතික කරන ලද, 2(1) වන වගන්තියේ සඳහන් යම් තැනැත්තකුට හෝ සමාගමකට ශ්‍රී ලංකාවේ ඉඩමක හිමිකම පැවරීම සිදු කරනු ලබන, ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ විධිවිධානවලට අනුව ලියාපදිංචි කිරීමේ කටයුතු අවසන් කරනු නොලැබූ යම් සාධන පත්‍රයක්, 1963 අංක 11 දරන මුදල් පනතේ VI වන කොටස ඉවත් කරනු ලැබුව ද, එය නොතකා, එකී පනතේ ඉවත් කරන ලද VI වන කොටසේ විධිවිධාන ප්‍රකාරව ලියාපදිංචි කරනු ලැබිය යුතු ය:

(ආ) 2013 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී මේ පනතට කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව සටහන් කරනු ලබන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ, ලියා සහතික කළ 2(1) වන සහ 5(1) වන වගන්තිවල සඳහන් යම් තැනැත්තකුට හෝ සමාගමකට, ශ්‍රී ලංකාවේ ඉඩමක සන්තකය පැවරීමට අදාළ යම් සාධන පත්‍රයක්, මෙම පනතේ විධිවිධානවලට යටත්ව, ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ විධිවිධානවලට අනුව, අදාළ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කළ යුතු ය.

වලංගු කිරීම.

21. 2013 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වී මේ පනතට කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව සටහන් කරනු ලබන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ, මේ පනත මගින් විධිවිධාන සලස්වා ඇති පරිදි ඉඩම් බදුකරණ බද්ද අයකරන හෝ එකතු කරන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා එම බද්ද අයකිරීම හෝ එකතු කිරීම, නිසි බලය ඇතිව කරනු ලැබූ හා කරනු ලබන බවට සලකනු ලැබිය යුතු අතර, ඒ අය කිරීම හෝ එකතු කිරීම වලංගු ආකාරයෙන් සිදු කර ඇති බව සලකනු ලැබිය යුතු ය. ඉහත සඳහන් කාලය සඳහා ඉඩම් බදුකරණ බද්ද අයකිරීම හෝ එකතු කිරීම සම්බන්ධයෙන් සියලු සිවිල් හෝ අපරාධ නඩු පැවරීමෙන්

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වගකීමෙන් මුක්ත කරනු ලැබිය යුතු ය.

ඉඩම් බදුකරණ බද්දේ ගෙවන ලද මුදල සහ නියම මුදල අතර යම් වෙනසක් අයකර ගැනීම

22. 21 වන වගන්තිය යටතේ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් අයකර ගනු ලැබූ හෝ එකතු කර ගනු ලැබූ ඉඩම් බදුකරණ බද්ද, 6 වන වගන්තිය යටතේ බදු ගැණුම්කරු විසින් ගෙවනු ලැබිය යුතු ඉඩම් බදුකරණ බද්දේ නියම ප්‍රමාණයට වඩා අඩු වන අවස්ථාවක, ඉඩම් බදුකරණ බද්ද වශයෙන් ගෙවිය යුතු නියම් මුදල සහ මේ වන විටත් අයකරගෙන හෝ එකතු කරගෙන ඇති මුදල අතර වෙනස, කොමසාරිස් ජනරාල්වරයා වෙත, අදාළ දැන්වීමේ දින සිට මාස හයක් ගතවීමට පෙර ගෙවන ලෙස, කොමසාරිස් ජනරාල්වරයා විසින් ලිඛිත දැන්වීමකින් බදු ගැණුම්කරුට නියම කළ යුතු ය.

ඉඩම් බදුකරණ බද්ද වශයෙන් ගෙවන ලද වැඩිපුර මුදල ආපසු ගෙවීම

23. (1) 21 වන වගන්තිය යටතේ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් අයකර ගනු ලැබූ හෝ එකතු කරගනු ලැබූ ඉඩම් බදුකරණ බද්ද, 6 වන වගන්තිය යටතේ බදු ගැණුම්කරු විසින් ගෙවිය යුතු ඉඩම් බදුකරණ බද්දේ නියම ප්‍රමාණයට වඩා වැඩි වන අවස්ථාවක, එසේ වැඩිපුර ගෙවා ඇති තැනැත්තා විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත, එම වැඩිපුර ගෙවා ඇති මුදල් ආපසු ගෙවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් වැඩිපුර ගෙවා ඇති මුදල එම ඉල්ලීම ලැබී මාස හයක් ඇතුළත ඉල්ලුම්කරුට ආපසු ගෙවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

24. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණ.

25. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ පනතේ—

"සන්තකය පැවරීම" යනුවෙන්, ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති ඉඩම් පැවරීමක්, බද්දට දීමක් හෝ උකස් කිරීමක් අදහස් වේ;

"බද්ධ නිවාස අයිතිකම් පනත" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනත අදහස් වේ;

"බැංකු පනත" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනත අදහස් වේ;

"පුරවැසි පනත" යන්නෙන්, (349 වන අධිකාරය වූ) පුරවැසි පනත අදහස් වේ;

"ශ්‍රී ලංකාවේ පුරවැසියා" යන්නෙන්, පුරවැසි පනත ප්‍රකාරව ශ්‍රී ලංකාවේ පුරවැසියකු අදහස් වේ;

"සමාගම් පනත" යන්නෙන්, 2007 අංක 7 දරන සමාගම් පනත අදහස් වේ;

"දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන්, දේශීය ආදායම් පනත යටතේ පත් කරන ලද හෝ පත් කරන ලදැයි සලකනු ලබන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා අදහස් වේ;

"තානාපති වරප්‍රසාද පනත" යන්නෙන් 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනත අදහස් වේ;

"විදේශිකයා" යන්නෙන්, ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකු අදහස් වේ;

"විදේශීය සමාගම" යන්නෙන්, ශ්‍රී ලංකාව හැර වෙනත් යම් රටක නීතිය යටතේ සංස්ථාගත කරන ලද පුද්ගල මණ්ඩලයක් හෝ සමාගමක් අදහස් වේ;

"කල්බදු මූල්‍යකරණ පනත" යන්නෙන් 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත අදහස් වේ;

"කල්බදු මූල්‍යකරණ ආයතනය" යන්නෙන්, කල්බදු මූල්‍යකරණ පනත යටතේ ලියාපදිංචි කරන ලද කල්බදු මූල්‍යකරණ ආයතනයක් අදහස් වේ;

"පාලක සමාගම" යන්නට, සමාගම් පනත යටතේ එම යෙදුමට දී ඇති අර්ථය ම ඇත්තේ ය;

"දේශීය ආදායම් පනත" යන්නෙන්, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත අදහස් වේ;

"ඉඩම" යන්නෙන්, යම් රජයේ හෝ පෞද්ගලික ඉඩමක් අදහස් වන අතර—

(අ) ඉඩමක් කෙරෙහි ඇති යම් සම්බන්ධතාවයක්;

(ආ) ජලයෙන් ආවරණය වූ යම් ඉඩමක්; සහ

(ඇ) ඒ ඉඩමේ පිහිටි යම් නිවාසයක් හෝ ගොඩනැගිල්ලක්,

ඇතුළත් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"පැවරීම" යන්නෙන්, යම් විකිණීමක්, පරිත්‍යාගයක්, ත්‍යාගයක් හෝ සමර්පණයක් මගින් හෝ ඒ යටතේ ඉඩමක හිමිකම වෙනත් තැනැත්තකුට මාරු කිරීමක් අදහස් වේ;

"තැනැත්තා" යන්නට, සංස්ථාගත හෝ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ;

"ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත" යන්නෙන්, (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත අදහස් වේ;

"පාලිත සමාගම" යන්නට, සමාගම් පනත යටතේ එම යෙදුමට ලබා දී ඇති අර්ථය ම ඇත්තේ ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළැඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.